# Classic ඩෙබිට් කාඩ්පත

**පරිශීලක මඟපෙන්වුම**

## ඔබට අවශ්‍ය ම මොහොතේ

## ඔබේ මුදල් භාවිත කිරීමේ පහසුව

# පටුන

පිටු අංක


1. HSBC Classic ඩෙබිට් කාඩ්පත 1
2. ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම පිළිබඳ වැදගත් තොරතුරු 3
3. ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිතයේදී වැදගත් වන ඉඟි 6
4. Debit කාඩ්පත් සඳහා වන නීතිරීති සහ කොන්දේසි 7

# 1. HSBC Classic ඩෙබිට් කාඩ්පත

## කාඩ්පතෙහි මුහුණත

1. ඩෙබිට් කාඩ්පත් අංකයः මේ ඔබට ම විශේෂිත වූ ඉලක්කම් 16 කින් යුත් කාඩ්පත් අංකයයි. බැංකුව සමඟ කරනු ලබන සියලු සන්නිවේදන/ලිපි ගනුදෙනුවල දී කරුණාකර මෙම අංකය සඳහන් කරන්න.

2. ඔබගේ නමः කාඩ්පතෙහි මුහුණත ඔබගේ නම නිවැරදිව හා ඇඟිලිතුඩුවලට දැනෙන සේ මුද්‍රණය කර ඇතිදැයි කරුණාකර පරීක්ෂා කර බලන්න.

3. වලංගු වනුයේ - අවලංගු වන දිනය (මාමා/වව)ः කාඩ්පත අවලංගු වන මාසය සහ වර්ෂය කරුණාකර පරීක්ෂා කර බලන්න. දක්වා ඇති මාසයේ අවසාන දිනය තෙක් ඔබේ ඩෙබිට් කාඩ්පත වලංගු වේ.

4. VISA ඉලෙක්ට්‍රොන් / VISA ලාංඡනය සහ හොලොග්‍රෑමයः මෙම ලාංඡනය ප්‍රදර්ශනය කරනු ලබන ලොව ඕනෑම වෙළඳ ආයතනයක් ඔබේ ඩෙබිට් කාඩ්පත පිළිගනු ඇත.

5. ඉලෙක්ට්‍රොනික භාවිතය පිළිබඳ සලකුණः මිල දී ගැනීමේ ගනුදෙනුවක දී, ඩෙබිට් කාඩ්පත භාවිත කළ හැක්කේ ඉලෙක්ට්‍රොනිකව පමණක් වන අතර, ඉලෙක්ට්‍රොනික අලෙවි ස්ථානයක් පවතින අලෙවි ආයතනවල දී පමණකි. ඩෙබිට් කාඩ්පත භාරගනු ලැබේ. ගෙවීම් ලබාගැනීමට "කඩදාසි මුද්‍රිතයන්" හෝ තැපැල්/දුරකථන/අන්තර්ජාල ඇණවුම් ගනුදෙනු සහිත අලෙවි ආයතනවල දී කරුණාකර ඔබේ ඩෙබිට් කාඩ්පත් භාවිත කිරීමට උත්සාහ නොකරන්න.

6. මූලික ගිණුම් අංකය {Primary account number (PAN)}ः මෙම ඉලක්කම් මඟින් දැක්වෙන මූලික බැංකු ගිණුමට මෙම ඩෙබිට් කාඩ්පත සම්බන්ධිත වේ.



# කාඩ්පතෙහි පසුපිට

7. චුම්භක තීරුව: ඔබේ ඩෙබිට් කාඩ්පත සම්බන්ධ වැදගත් තොරතුරු මෙහි කේතාංකනය කර ඇත. සීරීම් හෝ චුම්භක සහ චුම්භක ක්ෂේත්‍ර ආදියට නිරාවරණය වීමෙන් ඔබේ ඩෙබිට් කාඩ්පතෙහි චුම්භක තීරුවට හානිකර විය හැකි බැවින් කරුණාකර එවැනි හානිවලින් ඔබේ ඩෙබිට් කාඩ්පත ආරක්ෂා කරගන්න.

8. අත්සන සඳහා වෙන්කර ඇති කොටස: ඔබේ ඩෙබිට් කාඩ්පත ඔබ වෙත ලැබුණු වහාම නොමැකිය හැකි තීන්ත සහිත බෝල තුඩු පෑනකින් (කළු තීන්ත වඩාත් සුදුසු ය) කරුණාකර මෙම කොටසෙහි ඔබේ අත්සන තබන්න. වෙළඳ ආයතනවලදී ගෙවීම් පත්‍රිකාවලට ඔබ භාවිත කරනු ලබන අත්සන, ඩෙබිට් කාඩ්පතෙහි අත්සන සඳහා වන කොටසෙහි ඔබ තබන ලද අත්සන හා සමාන විය යුතු වේ.




9. පුද්ගලික හඳුනාගැනීමේ අංකය {Personal Identification Number (PIN)}: ATM ගනුදෙනු සඳහා ඔබේ නව PIN අංකය සමඟ ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිත කළ හැකි ය.

## 2. ඔබේ ඩෙබිට් කාඩ්පත සක්‍රීය කිරීම සම්බන්ධයෙන් භාවිත කළ හැකි වැදගත් තොරතුරු

ඔබ ළඟ දැනටමත් ඇති ATM PIN අංකය සමඟ, දේශීය HSBC ATM යන්ත්‍ර ඕනෑම එකකදී කාඩ්පත භාවිතයෙන් මිලදී ගැනීම් සිදුකිරීම සඳහා ඔබේ ඩෙබිට් කාඩ්පත ඔබට සක්‍රීය කළ හැකිය.

ඔබේ කාඩ්පත සක්‍රීය කරගැනීම සඳහා පැය 24 පුරා වන පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක 4 4722 22 හරහා අප ඇමතීමට ද ඔබට හැකිය.

### භාවිතය සඳහා මඟපෙන්වුම

HSBC වෙතින් ලද ඔබේ ඩෙබිට් කාඩ්පත ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශයන් හි ද වලංගු වන අතර, බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇති එය භාවිතය ද ඉතා පහසු

වෙළඳ ආයතනයන් වෙතින් මිලදී ගැනීම් සිදුකිරීම ආදිය සම්බන්ධයෙන් එය ක්‍රියා කරනුයේ ක්‍රෙඩිට් කාඩ්පත් ක්‍රියා කරන අන්දමට ම ය. එකම වෙනස වන්නේ, ඔබ සිදුකරනු ලබන ගනුදෙනුව ඔබේ ජංගම හෝ ඉතුරුම් ගිණුම වෙත සෘජුවම හර වීමයි.

ඔබේ ඩෙබිට්කාඩ්පත, ATM කාඩ්පත වශයෙන් ද භාවිත කළ හැකි බැවින්, ATM කාඩ්පත වශයෙන් තවත් කාඩ්පතක් රැගෙන යාමේ අවශ්‍යතාවක් මතු නොවේ.

### වෙළඳ ආයතනවල දී භාවිතය

ලොව පුරා පිහිටි මිලියන 29* ක VISA වෙළඳ ආයතනයන් හි සාප්පු සවාරිවල දී ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමේ හැකියාව තරම් තවත් පහසුවක් නොමැති තරම් ය. කරුණාකර පහත දී ඇති සරල පියවර අනුගමනය කරන්න.

1. වෙළඳ ආයතනයෙහි VISA/VISA Electron සලකුණ තිබේදැයි බලන්න. කාඩ්පත භාවිත (swipe) කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික අලෙවි ස්ථානයක් (POS) එම වෙළඳ ආයතනය සතුව තිබිය යුතු ය.

2. ඔබේ මිලදී ගැනීම සිදුකිරීමෙන් පසු, ඔබේ ඩෙබිට් කාඩ්පත ඉදිරිපත් කරන්න.

3. අවසර ලබාගැනීම සඳහා වෙළෙන්දා විසින් ඩෙබිට් කාඩ්පත swipe කරනු ඇත.

4. අවසර ලබාගැනීම සාර්ථකවීමෙන් පසු, ගනුදෙනු කළ මුදල වෙනුවට ඒ හා සමාන මුදලක් බැංකුව විසින් ඔබේ ගිණුමෙන් රඳවා ගනු ඇත. ඉන් අනතුරුව, ගනුදෙනු කළ මුදල ඔබේ ගිණුමෙන් හර කෙරෙනු ඇත.

5. අලෙවි පත්‍රිකාවක් උත්පාදනය කෙරෙනු ඇත.

6. අලෙවි පත්‍රිකාව පරීක්ෂා කර බලා, අත්සන් කරන්න. ඔබේ අත්සන, ඔබේ ඩෙබිට් කාඩ්පත පිටුපස ඇති ඔබේ අත්සනට සමාන විය යුතුය, නොඑසේ නම්, POS හි දක්වා ඇති ආකාරයට, වෙළෙන්දා විසින් ඉල්ලා සිටින විටෙක දී, පරීක්ෂා කර, ඔබේ ඩෙබිට් කාඩ්පතෙහි PIN අංකයෙහි ඉලක්කම් අංකනය කර ඇතුළත් කරන්න.

7. ඔබේ ඩෙබිට් කාඩ්පත නැවත ඔබ වෙත ලබාදුන් බවට සහතික වන්න.

ඔබගේ මූලික ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් තිබේ නම්, ඔබේ දෛනික ගනුදෙනු සීමාව වන රු.50,000/-ක මුදලක් දක්වා මිලදී ගැනීම් සිදුකිරීමට Classic ඩෙබිට් කාඩ්පත් හිමියකු වශයෙන් ඔබට හැකියාව ලැබේ.

### සැලකිය යුතුයි

* ඔබ ඉල්ලුම් කර ඇත්තේ දේශීය වශයෙන් වලංගු ඩෙබිට් කාඩ්පතක් නම්, ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිත කළ හැක්කේ ශ්‍රී ලංකාව තුළ ඇති වෙළඳ ආයතනයන් වෙතදී පමණක් බව කරුණාවෙන් සලකන්න.

## ATM යන්ත්‍ර භාවිතය

ශ්‍රී ලංකාව තුළ ඇති HSBC ATM යන්ත්‍ර ඕනෑම එකක් වෙතදී ඔබ කැමැති භාෂාව තෝරාගෙන,

- සකසන ලද සීමාව තුළ මුදල් ආපසු ගැනීමක් සිදු කරන්න
- ඔබ විසින් සිදු කරන ලද පසුගිය ගනුදෙනු 8 පිළිබඳව කුඩා ගිණුම් ප්‍රකාශනයක් ලබාගන්න
- ගිණුමෙහි පවතින ශේෂය පරීක්ෂා කරන්න
- ගිණුම් ප්‍රකාශන ඉල්ලුම් කරන්න
- ගිණුම් අතර මුදල් හුවමාරු කරන්න
- PIN අංකය වෙනස් කරන්න
- චෙක්පොතක් ඉල්ලුම් කරන්න

- මුදල්/චෙක්පත් තැන්පතු සිදුකරන්න, බැංකුව වෙත විද්‍යුත් තැපැල් ලිපියක් යොමු කිරීමට සිදු කළ හැකිය
- ඔබගේ උපයෝගිතා බිල්පත් ගෙවන්න
- ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වන ගෙවීම් සිදුකරන්න

## සැලකිය යුතුයි

* විදේශයක ඔබේ ඩෙබිට් කාඩ්පත් HSBC සමූහයට අයත් ATM යන්ත්‍රයකදී ඔබ විසින් භාවිත කළහොත්, රු.300/-ක ට සමාන මුදලක් ගනුදෙනු ගාස්තු වශයෙන් අය කෙරෙනු ඇත. ඔබේ ඩෙබිට් කාඩ්පත PLUS ATM යන්ත්‍රයකදී භාවිත කළහොත්, දේශීය ගනුදෙනු සඳහා රු.50/- ක් ද, ජාත්‍යන්තර ගනුදෙනු සඳහා රු.400/- ද බැගින් අය කෙරෙනු ඇත.

*වර්තමානය වන විට ඔබට පිවිසිය හැකි උපයෝගිතා ආයතන ලැයිස්තුව ලබාගැනීමට ඔබ කැමැති නම්, කරුණාකර පැය 24 පුරා වන අපගේ ක්ෂණික ඇමතුම් අංක 4 4722 00 ඔස්සේ අප අමතන්න.

* ATM යන්ත්‍ර වෙතින් එක් දිනක දී මුදල් ආපසු ගැනීම් සිදු කළ හැකි සහ මුදල් හුවමාරු කිරීම් සිදු කළ හැකි සීමාවන්

| **වත්මන් සීමාව** | **(රු.)** |
|---|---|
| මුදල් ආපසු ගැනීම් | 50,000.00 |
| තමන්ගේම ගිණුම් අතර හුවමාරු කිරීම් | 1,000,000.00 |
| තෙවන පාර්ශ්වයේ හුවමාරු කිරීම් | 200,000.00 |
| උපයෝගිතා බිල්පත් ගෙවීම් | 200,000.00 |

## සංචාරය කිරීම් දැනුම්දීම

ඔබ විදේශයක සිටින විට දී ඔබේ ඩෙබිට් කාඩ්පත සඳහා උපරිම ආරක්ෂණය සැපයීම සහතික කිරීම පිණිස, ඔබ විදේශ සංචාරයක නිරතවීමට අදහස් කරන විට ඔබේ සංචාරය පිළිබඳව කල් තබා අප වෙත දැනුම් දීමට කාරුණික වන්න. එඅපගේ පාරිභෝගික ක්ෂණික ඇමතුම් අංක 011 4 4722 00 ඔස්සේ අප අමතන්න, නැතිනම් අංක 011 4 5115 54 ඔස්සේ අප වෙත ෆැක්ස් මඟින් හෝ විද්‍යුත් තැපැල් personalbanking@hsbc.com.lk ලිපිනය හරහා අප වෙත ඒ බව දැනුම් දෙන්න.

## ජාත්‍යන්තර භාවිතය

දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ඔබ විසින් සිදුකරන ඩෙබිට් කාඩ්පත් ගනුදෙනු දෙවර්ගයම ඔබගේ මූලික ගිණුම් ප්‍රකාශනයෙහි දැක්වෙන බව කරුණාවෙන් සලකන්න. එක් එක් ජාත්‍යන්තර ගනුදෙනුව, ගනුදෙනුව සිදුකරන ලද ව්‍යවහාරික මුදලින් සහ රුපියල්වලින් සමාන මුදලින් පෙන්නුම් කෙරෙනු ඇත.

## 3. ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමේදී වැදගත්වන ඉඟි

HSBC වෙතින් ඔබ ලද ඩෙබිට් කාඩ්පත භාවිතය බෙහෙවින් සොඳුරු අත්දැකීමක් බව සහතික කිරීම පිණිස, සරල මඟපෙන්වීමක් පහතින් දක්වා ඇත.

- ඔබේ මුදල් කෙරෙහි ඔබ දක්වන සැලකිල්ල ම ඔබේ ඩෙබිට් කාඩ්පත කෙරෙහි ද දක්වන්න. එය අන් අයෙකු අතට පත් නොවන අයුරින්, සෑම අවස්ථාවකම ඔබ ළඟම තබාගන්න.
- ඔබේ ඩෙබිට් කාඩ්පත ඔබේ භාවිතය සඳහා පමණි. බැංකු ශාඛාවක, නම් කරන ලද බැංකු නිලධාරියකු හට හැරෙන්නට වෙනත් කිසිදු අයෙකු වෙත කිසිදු අවස්ථාවකදී එය භාර නොදිය යුතු අතර, බැංකු නිලධාරියාට භාරදීමට පෙර ද චුම්භක තීරුව හරහා කැබලි කිහිපයකට කපා වෙන් කළ යුතු වේ.
- ඔබගේ හඳුනාගැනීමේ අංකය (PIN) වෙනත් කිසිවකු වෙත හෙළිදරවු කිරීමෙන් හා භාරදීමෙන් වළකින්න. PIN අංකය සිතෙහි ධාරණය කරගැනීමෙන් පසු ඒ සම්බන්ධ සියලු සාක්ෂි විනාශ කර දමන්න. එසේම, එම අංකය පිටපත් කළ කිසිදු ලේඛනයක් ඔබේ ඩෙබිට් කාඩ්පත සමඟ තබා නොගන්න. හැකි ඉක්මනින් සහ වරින් වර (අවම වශයෙන් සෑම මාස තුනකට වරක්), ඔබ කැමැති අංකයකට ඔබේ PIN අංකය වෙනස්කරන ලෙසට ද අප නිර්දේශ කරමු.
- PIN අංකය මත පදනම් වූ ATM කාඩ්පත මෙන් නොව, ඩෙබිට් කාඩ්පත නැති වුවහොත් හෝ සොරකම් කළ හොත් එය අවභාවිත කළ හැකිය. ඔබේ ඩෙබිට් කාඩ්පත නැති වුවහොත්, එම කාඩ්පත අවහිර කරවීමට සහ ප්‍රතියෝජන කාඩ්පතක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම සඳහා කරුණාකර වහාම පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය අමතන්න.
- ඔබේ ඩෙබිට් කාඩ්පත නැවත-නිකුත්කර ගැනීමට හෝ අවසන් කිරීමට ඔබට අවශ්‍ය වුවහොත්, කරුණාකර ඔබේ ගිණුම පවතින HSBC ශාඛාව වෙත ඔබේ ලිඛිත ඉල්ලීම යොමු කරන්න. කරුණාකර, ඔබේ ඩෙබිට් කාඩ්පත චුම්භක තීරුව හරහා කැබලි කිහිපයකට කපා දමන්න.

- වෙළඳ ආයතනයන් හි දී ගනුදෙනු සිදුකරන විට, ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිතය ඔබ ඉදිරිපිට දී පමණක් සිදුකරන බවට සහතික වන්න. අසම්පූර්ණ අලෙවි පත්‍රිකාවක් කිසි විටෙක අත්සන් නොකරන්න.
- ඉලෙක්ට්‍රොනික අලෙවි ස්ථාන (electronic point-of-sale swipe terminals) රහිත වෙළඳ ආයතනයන් හි දී ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමට උත්සාහ නොගන්න.
- දුරකථන/විද්‍යුත් ලිපි/අන්තර්ජාලය හරහා "කාඩ්පත් ඉදිරිපත් කරනොමැති" තත්ත්වයන් යටතේ මිලදී ගැනීම් සඳහා කිසිදු අවස්ථාවක ඔබේ ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමට උත්සාහ නොගන්න.
- ඔබගේ දුරකථන අංක හෝ ලිපිනයේ කිසියම් වෙනසක් වූ වහාම, කරුණාකර ඒ බව HSBC වෙත ලිඛිතව දැනුම් දෙන්න.

**ඉතාමත් ඉහළ මට්ටමින් යුත් සේවාවක් ඔබ වෙත සැපයීමට සහ ඔබ උනන්දුවක් දක්වනු ඇතැයි අපට හැඟෙන, අපගේ සැලසුම් හා සේවා පිළිබඳව ඔබ දැනුවත් කිරීමට HSBC සෑම විටකම කටයුතු කරයි. ඔබට කිසියම් සහයක් අවශ්‍ය නම්, කරුණාකර පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය අමතන්න, නැතිනම් ඔබේ ශාඛා කළමනාකරු වෙත ලියන්න.**

## 4. ඩෙබිට් කාඩ්පත් සඳහා වන නීතිරීති සහ කොන්දේසි

තනි පුද්ගලයින් විසින් දරනු ලබන ඉතුරුම් සහ ජංගම ගිණුම් මත නිකුත් කරන ලද ඩෙබිට් කාඩ්පත භාවිතය පිළිබඳව වූ නීතිරීති සහ කොන්දේසි මෙම ලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකාරයට සහ බැංකුව විසින් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ආකාරයට විය යුතුය. කාඩ්පත් ඉල්ලුම් පත්‍රය අත්සන් කිරීම මඟින් හෝ කාඩ්පත ලැබීම ලිඛිතව පිළිගැනීමෙන් හෝ කාඩ්පතේ පිටුපස අත්සන් කිරීම මඟින් හෝ කාඩ්පත සමඟ ගනුදෙනුවක් සිදුකිරීම මඟින් හෝ වාර්තාවේ සඳහන් ලිපිනයට කාඩ්පත භාර දී දින දහයක් ගෙවීමෙන් පසුව හෝ මෙම නීතිරීති සහ කොන්දේසි ගිණුම් හිමියා (හිමියන්) විසින් කොන්දේසි විරහිතව පිළිගෙන භාරගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතුය. ගිණුම් හිමියා (හිමියන්) විසින් HSBC සමග ඇති ස්වකීය ජංගම/ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යෑම පිළිබඳව වූ නීතිරීති සහ කොන්දේසිවලින් ද බැඳී සිටීම අඛණ්ඩව පැවතිය යුතුය.

# අර්ථනිරූපන

1) ‘HSBC’ යන්නෙන් හොංකොං SAR නීති මඟින් සහ නීති යටතේ යථාපරිදි සංස්ථාගත කර ඇති බැංකු සංස්ථාවක් වූද, ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 1 ක්වීන්ස් පාර, සෙන්ට්‍රල්, හොංකොං යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 24 දරන ස්ථානයේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙනත් ස්ථානවල ශාඛා පිහිටා ඇත්තා වූ ද එකී ජනරජයේ ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන්නා වූ ද “HSBC” හෙවත් "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන බැංකුව සහ ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ පැවරුම් ලාභීන්ද ඇතුළත්වන) **‘ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්’** යන ආයතනය අදහස් වේ.

2) ‘ඩෙබිට් කාඩ්පත’ යන්නෙන් HSBC විසින් යම් කාඩ්පත් හිමියකු වෙත නිකුත්කරන ලද දේශීය/ජාත්‍යන්තර වශයෙන් වලංගු උචිත ඩෙබිට් කාඩ්පතක් අදහස් වේ.

3) ‘කාඩ්පත් හිමියා’ යන්නෙන් HSBC බැංකුව සමග පවත්වාගෙන යනු ලබන ගිණුමක් හේතුවෙන් බැංකුව විසින් ඩෙබිට් කාඩ්පතක් නිකුත්කර ඇති යම් තැනැත්තකු අදහස් වේ. කාඩ්පත් හිමියා පරම ගිණුම් හිමියා හෝ හවුල් ගිණුම් සම්බන්ධයෙන් වනවිට, පරම අත්සන්කරු හෝ තනිව ක්‍රියාකිරීම සඳහා බලය ලබා දුන් තැනැත්තා විය යුතුය.

4) ‘ගිණුම් හිමියා’ යන්නෙන් තනි පුද්ගල තත්ත්වයෙන් හෝ හවුල් දරන්නකු වශයෙන් HSBC සමඟ ගිණුමක් පවත්වාගෙන යනු ලබන යම් තනි පුද්ගලයකු (පුද්ගලයින්) අදහස් වේ.

5) ‘ගිණුම (ගිණුම්)’ යන්නෙන් තනි පුද්ගලයින් විසින් දරනු ලබන්නා වූ ද, ඩෙබිට් කාඩ්පතක් වලංගු ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු බවට HSBC විසින් නම්කර ඇත්තා වූ ද ඉතුරුම් හෝ ජංගම ගිණුම් අදහස් වේ.

6) ‘ATM’, යනුවෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් අදහස් වේ. නීතිරීති සහ කොන්දේසිවලට අනුව කාඩ්පත භාවිත කිරීම මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාලයක කොටසක් සංයුක්ත කරනු ලබන (කාඩ්පත නිකුත්කරන ලද රට තුළ හෝ රටෙන් පිටත) යම් සමාන යන්ත්‍රයක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් යන යෙදුමට ඇතුළත් වේ.

7) 'ප්‍රකාශන' යන්නෙන් අදහස් වන්නේ HSBC විසින් ගිණුම් හිමියා/හිමියන්ට දෙන ලද යම් කාලසීමාවක් තුළ ගිණුම හරහා සිදුකරන ලද ගනුදෙනු (ඩෙබිට් කාඩ්පත් ගනුදෙනු ඇතුළුව) පිළිබඳව සහ එම ගිණුමේ ශේෂය සඳහන් කරමින් එවනු ලබන වාර ප්‍රකාශනයකි. HSBC විසින් ඇතුළත් කිරීමට සුදුසු යැයි සලකන වෙනත් තොරතුරු ද එහි ඇතුළත් විය හැකිය.

8) 'ගනුදෙනුව' යන්නෙන් (උදාහරණ වශයෙන් මුදල් ආපසු ගැනීම්, අලෙවි මධ්‍යස්ථානවල දී කරනු ලබන ගෙවීම්, මුදල්/චෙක්පත් තැන්පතු යනාදී ගනුදෙනු) ගිණුම සම්බන්ධ අවසරලත් ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා බැංකුව වෙත ඍජුව හෝ වක්‍රව ඩෙබිට් කාඩ්පත භාවිතය මඟින් කාඩ්පත් හිමියකු විසින් දෙනු ලබන යම් අවසරලත් උපදෙස් අදහස් වේ.

9) 'වෙළඳ ආයතනය' යන්නෙන් ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ඕනෑම ස්ථානයක පිහිටා ඇති වෙළඳ ආයතන අදහස්වන අතර, වෙනත් ස්ථාන අතර එයට HSBC හෝ VISA ඉන්ටර්නැෂනල් විසින් ප්‍රචාරය ලබාදී ඇති වෙළඳ ආයතන, සාප්පු, අවන්හල්, ගුවන්සේවා ආයතන යනාදිය ඇතුළත් වේ.

10) 'මූලික ගිණුම' යන්නෙන් ඩෙබිට් කාඩ්පතට සම්බන්ධකර ඇති බහුවිධ ගිණුම් සම්බන්ධයෙන් වන විට උදාහරණයක් වශයෙන් මිලදී ගැනීම් ගනුදෙනු, ඩෙබිට් කාඩ්පතට අදාළ ගාස්තු සහ අයකිරීම් හරකරනු ලැබිය යුතු ගිණුම වන්නා වූ ප්‍රධාන/පළමු ක්‍රියාත්මක ගිණුම වශයෙන් නම්කර ඇති ගිණුම අදහස් වේ.

11) 'ජාත්‍යන්තර ගනුදෙනු' යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත HSBC ශාඛාවලින් කාඩ්පත් හිමියා විසින් සිදුකරනු ලබන සියලු ගනුදෙනු අදහස් වේ.

12) "VISA" යන්නෙන් VISA ඉන්ටර්නැෂනල් විසින් සන්තකය දරනු ලබන ලකුණක් අදහස් වේ.

13) "VISA ATM ජාලය" යන්නෙන් ඩෙබිට් කාඩ්පත් පිළිගනු ලබන සහ VISA හෝ ඉලෙක්ට්‍රොන් ලාංඡනය ප්‍රදර්ශනය කරනු ලබන ATM යන්ත්‍ර අදහස් වේ.

14) පද භාවිතය 'ඔබ', 'ඔබගේ', 'ඔහුට', හෝ සමාන සර්ව නාම පද භාවිතය මඟින් එසේ පිළිගනු ලබන අවස්ථාවල දී උචිත ලෙස ගිණුම් හිමියා හෝ කාඩ්පත් හිමියා අදහස් කරනු ලැබිය යුතු ය. පුරුෂලිංග වචන සඳහා වූ සියලු සඳහන් කිරීම් මඟින් ස්ත්‍රීලිංග වචන ද ඇතුළත් වන්නේ ය.

## ඩෙබිට් කාඩ්පත නිකුත් කිරීම

1) ඩෙබිට් කාඩ්පත නිකුත් කිරීම හා භාවිතය ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් පනවනු ලබන රෙගුලාසිවලට මෙන්ම HSBC හි කලින් කලට බලාත්මකව පවතින නීතිරීති සහ කොන්දේසිවලට ද යටත් වේ.

2) ඩෙබිට් කාඩ්පත හා ඊට අදාළ පුද්ගලික හඳුනාගැනීමේ අංකය (රහස්‍ය අංකය - PIN) කාඩ්පත් හිමියාගේ නමින් නිකුත් කරනු ලබන අතර, එකී ඩෙබිට් කාඩ්පත ඔහුගේ/ඇයගේ භාරයේ තබාගැනීම සම්බන්ධයෙන් එම තැනැත්තා වගකිවයුතු වනු ඇත.

3) ඩෙබිට් කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකිවයුතු වනු ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මඟපෙන්වුම් හෝ විනිමය පාලන පනතෙහි සහ/හෝ මෙහෙයුම් උපදෙස් සහ/හෝ ඒ යටතේ නිකුත් කළ රෙගුලාසි (විනිමය පාලන රෙගුලාසි) හෝ එවකට බලපවත්වන වෙනත් යම් නීති, රීති හා රෙගුලාසි කඩකිරීම මඟින් පැනනගින යම් අපරාධ නඩුවක් ද ඇතුළත්ව ඩෙබිට් කාඩ්පත හෝ ඊට අදාළ පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) අනවසරයෙන් භාවිත කිරීම මඟින් සිදුවන හානියක් හෝ පාඩුවක්, හවුල් ගිණුම් සම්බන්ධයෙන් නම්, සියලුම ගිණුම් හිමියන් එක් ව හා වෙන් වෙන් ව, ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම, රහස්‍ය අංකයේ සුරක්ෂිත භාවය, සහ ඩෙබිට් කාඩ්පත භාවිත කරමින් සිදුකරන ගනුදෙනුවක්/ගනුදෙනු මඟින් පැනනගින සියලුම නඩුකර, පාඩු සහ හානි සම්බන්ධයෙන් ඉහත පරිදි බැංකුව හානිපූරණය කරනු ඇත. එවැනි හවුල් ගිණුම් සම්බන්ධයෙන්, කාඩ්පත් හිමියා මත පවතින සියලු කාර්යයන්, වගකීම් හා වගවීම් පිළිබඳව සියලුම ගිණුම් හිමියන් එක් ව හා වෙන් වෙන් ව වගකීමට හා වගවීමට බැඳී සිටිනු ඇත.

4) ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමෙන් සිදුකරන යම් මුදල් ආපසු ගැනීමක්, මාරුකිරීමක් සහ/හෝ වෙනත් යම් ගනුදෙනුවක් සම්බන්ධ මුදල ගිණුමෙන් හර කරනු ඇත. යම් ගනුදෙනුවක් සඳහා ප්‍රමාණවත් අරමුදල් කාඩ්පත් හිමියා විසින් ගිණුමෙහි පවත්වාගත යුතුය. බැංකුව වෙත පවතින ගිණුම අයිරා කිරීමට හෝ කාඩ්පත භාවිත කරමින් බැංකුව සමඟ එකඟ වී ඇති අයිරාවක් ඇත්නම්, එහි සීමාව ඉක්මවා මුදල් ලබාගැනීමට කාඩ්පත් හිමියාට හිමිකමක් නොමැත.

## කාඩ්පත් හිමියාගේ වගකීම් සහ කාඩ්පතෙහි වලංගු භාවය

1) කාඩ්පත් හිමියා විසින් ඩෙබිට් කාඩ්පත ලැබුණු වහාම ඒ මත අත්සන් තැබිය යුතුය. කාඩ්පත් හිමියා විසින් එය භාවිතා කිරීමට අන් කිසිවෙකුට අවසර නොදිය යුතු අතර, සියලුම අවස්ථාවන් හි දී ඩෙබිට් කාඩ්පත ඔහුගේ/ඇයගේ පෞද්ගලික පාලනයෙහි තබාගැනීම මඟින් ඩෙබිට් කාඩ්පත අවභාවිතයන්ගෙන් ආරක්ෂා කරගත යුතු වේ.

2) ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම සඳහා කාඩ්පත් හිමියා වෙත නිකුත් කර ඇති පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) හෝ කාඩ්පත් හිමියා විසින් පුද්ගලික හඳුනාගැනීමේ අංකය ලෙස තෝරාගෙන ඇති වෙනත් යම් අංකයක් කාඩ්පත් හිමියාගේ භාවිතය පිණිස වන අතර, වෙනත් අයෙකුට පැවරිය නොහැකි අතර, ඉතාම රහසිගත වේ. වෙනත් පාර්ශ්වයක් විසින් භාවිත කරනු ලැබීමට පහසු විය හැකි පරිදි රහස්‍ය අංකය කිසිදු ආකාරයකින්, කිසිදු තැනක හෝ කිසිදු ක්‍රමයකින් ලිඛිතව වාර්තාගත කර නොතැබිය යුතුය. ස්වේච්ඡාවෙන් හෝ එසේ නොමැතිව කිසිදු තත්ත්වයක් යටතේ කිසිදු ආකාරයකින් පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) වෙනත් කිසිදු තෙවන පාර්ශ්වයක් වෙත හෙළිදරව් නොකළ යුතුය.

3) දක්වා ඇති මාසයේ/වර්ෂයේ අවසන් දිනය දක්වා ඩෙබිට් කාඩ්පත වලංගු වේ. ඩෙබිට් කාඩ්පත කල් ඉකුත්වීමෙන් පසුව එය කොටස් කිහිපයකට කපා දැමීම මඟින් එය විනාශ කිරීමට කාඩ්පත් හිමියා භාරගනියි. HSBC හි අභිමතය පරිදි ගිණුමෙහි චර්යාව ඇගයීමෙන් පසුව ඩෙබිට් කාඩ්පත කල් ඉකුත්වීමට පෙර අලුත් කළ ඩෙබිට් කාඩ්පත කාඩ්පත් හිමියා වෙත යවනු ලබනු ඇත. කල් ඉකුත්වීමෙන් පසු ඩෙබිට් කාඩ්පත අලුත් කිරීමෙහි පරම අයිතිය HSBC සතු වේ.

## ATM යන්ත්‍ර භාවිතය

1) HSBC සමූහයේ ATM යන්ත්‍ර හා VISA ATM ජාලයේ සාමාජිකයින් වන ලොව පුරා වෙනත් බැංකු ජාලවල ATM යන්ත්‍රවල දී ඩෙබිට් කාඩ්පත භාරගැනෙනු ඇත.

2) බැංකුව විසින් එහි අභිමතය පරිදි, ATM අරමුදල් මාරුකිරීමේ පහසුකම සහ සියලුම ආකාරයේ ගනුදෙනු සඳහා සියලුම අරමුදල් මාරුකිරීමේ පහසුකම තාවකාලිකව ඉවත්කිරීම හෝ අවසන් කිරීම හෝ සිදුකළ හැක. එසේම, ATM යන්ත්‍ර හරහා දිනකට අරමුදල් මාරුකිරීම සඳහා සහ මුදල් ආපසු ගැනීම සඳහා වන උපරිම සීමාව වෙනස් කිරීමේ අයිතිය ද බැංකුව රඳවාගනියි.

3) ශ්‍රී ලංකාව හැර වෙනත් රටවල දී HSBC සමූහයේ/VISA ATM යන්ත්‍රවල දී කාඩ්පත් හිමියන් විසින් සිදුකරන මුදල් ආපසු ගැනීම්, පවතින ගාස්තු අයකිරීම්වලට අනුකූලව මුදල් ආපසු ගැනීමේ ගාස්තුවකට යටත් වනු ඇත. ශ්‍රී ලංකාවේ VISA ATM යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම් ගාස්තුවකට යටත් වනු ඇති අතර, මුදල් ආපසු ගැනීම් සිදුකරන අවස්ථාවේ දී ගිණුමට හර කෙරෙනු ඇත.

4) යම් ATM යන්ත්‍රයක දී ඩෙබිට් කාඩ්පත භාවිත කරමින් තැන්පත් කළ මුදල් සහ/හෝ චෙක්පත් ගිණුමට බැරකරනු ලබන්නේ බැංකුව විසින් තහවුරු කරගැනීමෙන් පසුව පමණක් වන අතර, එය සියලුම කරුණු සඳහා අවසානාත්මක හා බන්ධනීය වේ. තැන්පත් කරන අවස්ථාවේ දී ATM යන්ත්‍රය විසින් නිකුත් කරන ATM කාඩ්පත් හිමි උපදෙස් පත්‍රිකාව මඟින් කාඩ්පත් හිමියා තැන්පත් කර ඇත්තේ යැයි කියන දෑ පමණක් නියෝජනය වන අතර, එය බැංකුව මත බැඳීමක් ඇති නොකරයි. චෙක්පත් භාරගනු ලබන්නේ එකතු කරගැනීම සඳහා පමණක් වන අතර, එම චෙක්පත් නිශ්කාශනය කෙරෙන තෙක් අරමුදල් ලබාගත නොහැකි වනු ඇත. HSBC ATM යන්ත්‍රයක් මඟින් කරන සියලුම මුදල් ආපසු ලබාගැනීම් සඳහා එසේ මුදල් ගන්නා අවස්ථාවේ දී ATM යන්ත්‍රය මඟින් නිකුත් කරන ප්‍රකාශන වෙනත් අයුරකින් HSBC විසින් තහවුරු නොකළහොත් අවසානාත්මක වනු ඇත. එවැනි යම් තහවුරු කිරීමක් ද ඒ අයුරින් ම අවසානාත්මක සහ තීරණාත්මක වනු ඇති අතර, එම තහවුරු කළ මුදල කාඩ්පත් හිමියා මත බන්ධනීය වනු ඇත.

5) ඩෙබිට් කාඩ්පත නිකුත් කළ රට හැර වෙනත් රටක දී ලබාගන්නා ATM සේවාවන්, එම රටෙහි බලාත්මකව පවතින රෙගුලාසි මඟින් පාලනය වනු ඇත. දැනුම්දීමකින් තොරව මෙම සේවාවන් ඉවත් කරගනු ලැබුවහොත්, ඒ සම්බන්ධයෙන් HSBC වග නොකියනු ඇත.

## අලෙවි ආයතන භාවිතය

1) ඩෙබිට් කාඩ්පත පවතින්නේ ඉලෙක්ට්‍රොනික භාවිතය සඳහා පමණක් වන අතර, ඉලෙක්ට්‍රොනික අලෙවි ස්ථානයක් (point of sale swipe terminal) පවතින අලෙවි ආයතනවල දී පමණක් ඩෙබිට් කාඩ්පත භාරගනු ලැබේ. ඉලෙක්ට්‍රොනික අලෙවි ස්ථානයක් හරහා හැර වෙනත් අලෙවි ආයතනයන් හි දී කාඩ්පත භාවිත කිරීම අනවසර බවට සැලකෙන අතර, එවැනි ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකිව යුතු වනු ඇත.

2) ආරක්ෂක අංගයක් ලෙස, නිකුත් කරන ලද ඩෙබිට් කාඩ්පත, අලෙවි ආයතනවල භාවිතය සඳහා මුලින් ම අක්‍රීය වේ. අලෙවි ආයතනවල දී ගනුදෙනු සඳහා ඩෙබිට් කාඩ්පත සක්‍රීය කිරීම සඳහා, කාඩ්පත් හිමියා විසින් HSBC පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය ඇමතිය යුතු වේ.

3) අලෙවි ආයතනයන් හි දී, ගෙවීම් සිදුකිරීම සඳහා ඩෙබිට් කාඩ්පත භාවිත කරන සෑම අවස්ථාවක දී ම කාඩ්පත් හිමියා විසින් අලෙවි ලදුපත මත අත්සන් තැබිය යුතු අතර, කාඩ්පත් හිමියාගේ පිටපත තමා ළඟ තබාගත යුතුය. අතිරේක ගාස්තුවක් අයකර, අලෙවි ලදුපත්වල පිටපත් HSBC විසින් සපයනු ඇත. ඩෙබිට් කාඩ්පත් අංකය සඳහන් කර ඇති කාඩ්පත් හිමියාගේ අත්සන සහිත අලෙවි ලදුපතක් කාඩ්පත් හිමියාගේ වගකීමේ ප්‍රමාණය සම්බන්ධව HSBC සහ කාඩ්පත් හිමියා අතර තීරණාත්මක වන සාක්ෂියක් වනු ඇත. HSBC විසින් කාඩ්පත් හිමියාට භාණ්ඩ/සේවාව ඔහු/ඇය තෘප්තිමත් වන පරිදි ලැබී/ලබාගෙන ඇති බවට තහවුරු කරගැනීම අවශ්‍ය නොවේ. කාඩ්පත් හිමියා විසින් පෞද්ගලිකව අත්සන් කර නොමැති නමුත් කාඩ්පත් හිමියා විසින් අවසර ලබා දී ඇතැයි ඔප්පු කළ හැකි අලෙවි ලදුපත් ද කාඩ්පත් හිමියාගේ වගකීම යටතට වැටෙන සේ සැලකේ.

4) VISA ලාංඡනය ප්‍රදර්ශනය කෙරෙන ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි සියලුම ඉලෙක්ට්‍රොනික අලෙවි ආයතනවල දී ඩෙබිට් කාඩ්පත පිළිගැනෙනු ඇත. භාණ්ඩ හා සේවා සැපයීම ද ඇතුළත්ව ඊට සීමා නොවී, අලෙවි ආයතන විසින් කාඩ්පත් හිමියා සමඟ කරන ගනුදෙනු කිසිවක් සම්බන්ධයෙන් HSBC වගකීම භාරනොගනු ඇත. වට්ටම් වැනි ප්‍රතිලාභ කාඩ්පත් හිමියාට සපයන තෙවන පාර්ශ්ව විසින් සපයන භාණ්ඩ හා සේවාවල තත්ත්වය සම්බන්ධයෙන් HSBC කිසිදු නියෝජනයක් නොකරනු ඇත. සේවාවන් කිසියම් ආකාරයකින් අසම්පූර්ණ හෝ අසතුටුදායක වුවහොත්, HSBC ඒ සම්බන්ධව වග නොකියනු ඇත. යම් අලෙවි ආයතනයක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියාට කිසියම් පැමිණිල්ලක් ඇතොත් එම කරුණ අලෙවි ආයතනය සමඟ විසඳාගත යුතු අතර, ඊට අසමත්වීමක් මගින් කාඩ්පත් හිමියාට HSBC වෙත පවතින වගකීම් කිසිදු අයුරකින් අඩුවීමක් සිදු නොවේ. කෙසේ වුවද, හැකි සෑම අවස්ථාවක දී ම කාඩ්පත් හිමියාට සහයවීමට HSBC උත්සහ දරනු ඇත. මේ සඳහා, කාඩ්පත් හිමියා විසින් අදාළ තහවුරුකිරීමේ ලේඛන ද සහිතව පැමිණිල්ල සම්බන්ධව වහාම HSBC වෙත දැනුම් දිය යුතු වේ.

5) හිඟ මුදල්, නීතිමය වියදම් (නියෝජිතයෙකු වෙත කාරණය යොමු කිරීමට අවශ්‍ය වුවහොත්) අයකරගැනීමේ දී හෝ මතභේදය සමථකිරීමේ දී හෝ නීතිමය සම්පත් භාවිත කර ඇත්නම්, ඒ සම්බන්ධයෙන් වන සියලුම පිරිවැය සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වනු ඇත.

6) කිසියම් අලෙවි ආයතනයක් ඩෙබිට් කාඩ්පත භාරගැනීම ප්‍රතික්ෂේප කළහොත්, ඒ සම්බන්ධව HSBC කිසිදු වගකීමක් භාර නොගනී.

7) යම් අලෙවි ආයතනයක් විසින් අයකරනු ලබන හා ගනුදෙනු මුදල ද සමග ගිණුමෙන් හරකරනු ලබන යම් අධිභාරයක් සඳහා HSBC කිසිදු වගකීමක් භාර නොගනී.

8) යම් මිලදීගැනීමක් සහ ඉන් අනතුරුව භාණ්ඩ/සේවා අවලංගු කිරීමක් මඟින් මුදල් බැරකිරීමක් යනු වෙන් වෙන් ගනුදෙනු දෙකකි. ආපසු ගෙවීම අලෙවි ආයතනය වෙතින් ලැබුණු විටෙක පමණක් ගිණුමට (අවලංගු කිරීමේ ගාස්තු අඩුකොට) බැර කරනු ඇත. ආපසු ගෙවීමේ දිනයේ සිට දින 30ක් තුළ ගිණුමට මුල් බැරකර නොමැති නම්, කාඩ්පත් හිමියා විසින් අලෙවි ආයතනයේ බැර සටහනක පිටපතක් සමග ඒ බව HSBC වෙත දැනුම් දිය යුතුය.

9) බහුවිධ ගිණුම්වලට ඩෙබිට් කාඩ්පත සම්බන්ධ කර ඇති අවස්ථාවක, අලෙවි ආයතනවල දී සිදුකරන ගනුදෙනු ප්‍රාථමික ගිණුමට හර කරනු ඇත. එම ගනුදෙනුවලට ගෙවීමට මෙම ගිණුමෙහි පවතින අරමුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවක ඩෙබිට් කාඩ්පතට සම්බන්ධ කර ඇති අනෙක් ගිණුම්වල එක් ව හෝ වෙන් වෙන් ව අවශ්‍ය අරමුදල් පැවතිය ද HSBC විසින් එම ගනුදෙනු සඳහා නොගෙවනු ඇත.

**ජාත්‍යන්තර භාවිතය**

1) ඩෙබිට් කාඩ්පත සියලු අවස්ථාවල දී දැඩි ලෙස විනිමය පාලන නියෝගවලට එකඟව භාවිත කරනු ලැබිය යුතුය. එකී නියෝගවලට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, විනිමය පාලන නියෝග යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා ගිණුම් හිමියා (හිමියන්) ඒකාබද්ධව සහ වෙන් වෙන් ව වගකියනු ලැබිය යුතු අතර, එවැනි අවස්ථාවක දී HSBC විසින් නිකුත් කරන ලද ඩෙබිට් කාඩ්පත දරා සිටීම HSBC විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් අවහිර කරනු ලැබිය හැකිය. ගිණුම් හිමියන් විසින් විනිමය පාලන නියෝගවල විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම පැහැර හැරීම හේතුවෙන් උපචිතවන යම්/සියලු අහිතකර බලපෑම් වලින් HSBC හානිපූරණය කර නිදහස්ව තැබීමට ගිණුම් හිමියා (හිමියන්) එක් ව සහ වෙන් වෙන් ව වගකියනු ලැබිය යුතුය.

2) නැති වූ ඩෙබිට් කාඩ්පත ආරක්ෂිතව තබාගැනීමට සාධාරණ සුපරීක්ෂාවක් හා ක්‍රියාශීලී බවක් දක්වන ලද බව ද, නැතිවීම/සොරකම් කිරීම පිළිබඳව ඉක්මනින් වාර්තා කළ බව ද, කාඩ්පත් හිමියා සද්භාවයෙන් ක්‍රියාකළ බව ද ඔප්පු කිරීමට යටත්ව, මෙම කොටසෙහි 1 වගන්තියට

අනුව නැතිවූ බව ලිඛිතව වාර්තා කිරීමෙන් පසුව, නැතිවූ ඩෙබිට් කාඩ්පතක් භාවිත කර අලෙවි ආයතනවල දී සිදුකළ ගනුදෙනු සම්බන්ධව වගකීම ශූන්‍ය වනු ඇත. (මෙම අංගය මින් මතුවට 'ශූන්‍ය නැතිවූ කාඩ්පත් වගකීම' යනුවෙන් හැඳින්වේ) කෙසේ වුවද, ATM යන්ත්‍ර මඟින් මුදල් ආපසු ගැනීම් සම්බන්ධව, එවැනි ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා රහසිගතව තබාගත යුතු පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) අවශ්‍ය වන හෙයින්, එම 'ශූන්‍ය නැතිවූ කාඩ්පත් වගකීම' අදාළ නොවනු ඇත.

3) නැතිවූ බව/සොරකම් කළ බව, මෙම කොටසෙහි 1 වගන්තියට අනුව ලිඛිතව HSBC බැංකුව වෙත වාර්තා නොකළහොත් හෝ මෙම කොටසෙහි 1 වගන්තියට අනුව HSBC වෙත දැන්වීමට පෙර නැතිවී අවභාවිත කළ ඩෙබිට් කාඩ්පත නැතිවීම හෝ අවභාවිතය නිසා ඇතිවන ඕනෑම වගකීමකට (සිවිල් හෝ අපරාධ), පාඩුවකට, පිරිවැයකට, වියදමකට හෝ හානියකට එරෙහිව කාඩ්පත් හිමියා විසින් මෙමඟින් HSBC හානිපූරණය කරයි.

4) කාඩ්පත් හිමියා විසින් අදාළ නීතිරීතිවලට අනුකූලව සෑම අයුරකින්ම ක්‍රියාකරන බවට යටත්ව, HSBC හි තනි අභිමතය පරිදි අදාළ ගාස්තු මත අලුත් ඩෙබිට් කාඩ්පතක් නිකුත් කරනු ඇත. අලුත් කාඩ්පත නිකුත් කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය බැංකුව විසින් ගිණුමෙන් හර කරනු ඇත.

5) ඉන් පසුව කාඩ්පත් හිමියා විසින් ඩෙබිට් කාඩ්පත අත්පත් කරගත හොත්, එය භාවිත නොකළ යුතුය. ඩෙබිට් කාඩ්පතෙහි චුම්භක තීරුව හරහා එය කැබලි කිහිපයකට කපාදැමීම මඟින් එම කාඩ්පත විනාශ කළ යුතුය.

## ප්‍රකාශන සහ වාර්තා

1) ඩෙබිට් කාඩ්පත් ගනුදෙනු පිළිබඳ වාර්තා HSBC විසින් එවනු ලබන ප්‍රකාශනයේ සඳහන් වේ. ගිණුමට අදාළ නීතිරීති සහ කොන්දේසි ප්‍රකාරව, වාර්තාවේ සඳහන් තැපැල් ලිපිනයට කාලසීමා පදනමක් මත, එකී ප්‍රකාශන ගිණුම් හිමියා වෙත තැපැල් කරනු ලැබිය යුතුය. ඩෙබිට් කාඩ්පත භාවිතයෙන් HSBC විසින් සකස් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාව සියලු කාර්ය සඳහා තීරණාත්මක සහ බැඳීම් සහගත වන්නේ ය.

2) ගිණුම් ප්‍රකාශනය ('දින 30 සමාලෝචනය') කාඩ්පත් හිමියා වෙත ලැබී ඇති ලෙස සලකනු ලබන දින සිට කැලැන්ඩර් දින 20ක ට (විස්සකට) අඩු නොවන කාලයක් ඇතුළත එම එක් එක් ගිණුම් ප්‍රකාශනය ලැබීමෙන් පසුව, එම ගිණුම් ප්‍රකාශනයේ සඳහන් එක් එක් සටහන පරීක්ෂාකර තහවුරු කිරීම සඳහා සහ කාඩ්පත් හිමියාගේ පුද්ගලික ගිණුම සමඟ එය සසඳා

බැලීම සඳහාත් (ඒකාබද්ධව 'ගිණුම් අක්‍රමිකතා' යනුවෙන් සඳහන් කරනු ලබන) එම ගිණුම් ප්‍රකාශනයේ සඳහන් වංචා සහගත හෝ අවසර නොලත් ගනුදෙනු හෝ වෙනත් යම් විරෝධතා ද ඇතුලුව යම් වැරදි, අත්හැරීම්, අක්‍රමිකතා පිළිබඳව වහාම බැංකුවට දැනුම්දීම සඳහාත් කාඩ්පත් හිමියා එකඟවී සිටියි. දින 30 (තිහ) ඇතුළත වූ සමාලෝචනය පිළිබඳව බැංකුව වෙත දැනුම්දීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත්, ගිණුම් ප්‍රකාශනයේ (ගිණුම් ප්‍රකාශනවල) පෙන්නුම් කරනු ලබන අතිරික්තය සහ ගිණුම් අක්‍රමිකතා ඇතුලු සියලු සඳහන් කිරීම් නිවැරදි, සම්පූර්ණ, බලයලත් සඳහන් කිරීම් ලෙස කාඩ්පත් හිමියා විසින් පිළිගෙන ඒ පිළිබඳව බැඳී සිටින ලෙස සලකනු ලබන අතර, මෙම වගන්තිය ප්‍රකාරව ගනුදෙනු පිළිබඳව කාඩ්පත් හිමියා නිවේදනයක් ලබා දී ඇති අවස්ථාවක දී හැර, වඩාත් මෑත කාලීන ගිණුම් ප්‍රකාශන දින දක්වා සිදුවූ සෑම ගනුදෙනුවක් සඳහාම වූ සියලු වගකීමෙන් බැංකුව නිදහස් වන්නේ ය. මෙකී අවශ්‍යතාවන් හි කිසියම් උල්ලංඝනයවීමක් සිදුවුවහොත් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත ඒ බව වාර්තා කිරීමේ අයිතිය HSBC රඳවා ගනියි.

3) පවතින විනිමය පාලන රෙගුලාසිවලට අනුව, ජාත්‍යන්තරව වලංගු ඩෙබිට් කාඩ්පතක් රුපියල් ගිණුම්වලට ප්‍රවේශවීම සඳහා අනේවාසිකයෙකු වෙත නිකුත් කිරීම සිදු කළ නොහැක.

4) නීතිය, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් මඟින් යම් සංශෝධනයක් අවශ්‍ය කෙරේ නම්, මෙම නීතිරීති සහ කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වී පවතිනු ඇත.

## ගාස්තු සහ අයකිරීම්

1) පවත්නා අයබදුවලට අනුව කාඩ්පත් නිකුත්කිරීම/අලුත්කිරීම මත, ඩෙබිට් කාඩ්පත සඳහා වූ වාර්ෂික ගාස්තුව මූලික ගිණුමෙන් හරකරනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

2) වෙනත් යම් ඩෙබිට් කාඩ්පත් ආශ්‍රිත ගාස්තු, පවත්නා අයබදුවලට අනුව, කලින් කලට, ගිණුමෙන් හරකරනු ලැබේ.

3) කාඩ්පත් හිමියාට දැනුම්දීමකින් තොරව, අදාළ අයබදු කලින් කල වෙනස් කිරීමේ පරම අයිතිය බැංකුව විසින් රඳවා ගනු ලැබේ. ඉල්ලීමක් කිරීම මඟින් බැංකුවේ ගාස්තු ලේඛන පොත්පිංච කාඩ්පත් හිමියා වෙත සපයනු ලැබේ.

4) විදේශ ව්‍යවහාර මුදල්වලින් වූ සියලු ගාස්තු ශ්‍රී ලංකා රුපියල්වලින් යුත් ගිණුමට බිල්ගත කරනු ලැබේ. HSBC විසින් හෝ VISA විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අනුපාතික අනුව විදේශ ව්‍යවහාර මුදලින් දරන ලද ගාස්තු ශ්‍රී ලංකා රුපියල්වලට සමාන

මුදලකට පරිවර්තනය කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් HSBC සහ VISA වෙත මෙයින් බලය පවරනු ලැබේ.

5) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයෙහි ඉන්ධන හල්වලින් ලබාගත හැකි පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ වෙනත් සැපයුම් මිළ දී ගැනීමේ දී හැසිරුම් ගාස්තුවකට යටත් වන අතර, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතිකයකට අනුව එකී ගාස්තුව ඩෙබිට් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත. විකුණුම් කෙටුම්පතෙහි අනුමත කළ මුදල කාඩ්පත් ගිණුමට හර කළ මුදලට වඩා වෙනස් විය හැකිය.

## තොරතුරු හෙළිදරව් කිරීම

1) HSBC විසින් ඉල්ලා සිටි විටෙක, ඩෙබිට් කාඩ්පත නිකුත් කිරීම, එය පවත්වාගෙන යාම, ඩෙබිට් කාඩ්පත භාවිතා කර ගනුදෙනු සිදුකිරීම, ඩෙබිට් කාඩ්පත අලුත් කිරීම හෝ ඩෙබිට් කාඩ්පතට සම්බන්ධ වෙනත් යම් කරුණක් සඳහා HSBC විසින් අවශ්‍ය යැයි සලකන යම් තොරතුරක්, වාර්තා හෝ සහතික කාඩ්පත් හිමියා විසින් සපයනු ඇත. ඕනෑම ආකාරයකින් හෝ අවශ්‍ය යැයි සලකන ඕනෑම මූලාශ්‍රයකින් හෝ සපයන ලද තොරතුරු තහවුරු කරගැනීම සඳහා කාඩ්පත් හිමියා HSBC වෙත අවසර දෙයි. එම තොරතුරු/දත්ත නොසපයන්නේ නම් හෝ වැරදි තොරතුරු / දත්ත සපයා ඇත්නම් හෝ HSBC විසින් සිය තනි අභිමතය පරිදි ඩෙබිට් කාඩ්පත නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ වහාම ඩෙබිට් කාඩ්පත අවලංගු කිරීම හෝ සිදුකළ හැකිය.

2) යම් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත, අර්ධ අධිකරණ ආයතන වෙත, නීති බලාත්මක කිරීමේ නියෝජිත ආයතන හෝ රජයේ වෙනත් යම් ඒකකයක් වෙත කාඩ්පත් හිමියා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේ අයිතිය HSBC විසින් රඳවා ගනු ලැබේ.

3) යම් විද්‍යුත් අරමුදල් පැවරුම් ජාලයක් සම්බන්ධයෙන් ප්‍රවේශවීම අවශ්‍ය බවට හෝ උචිත බවට සලකනු ලබන හෝ ඩෙබිට් කාඩ්පත භාවිතය හෝ මෙහෙයවීම හේතුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් උපචිතවන යම් බැඳීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත බවට බැංකුව විසින් සලකනු ලබන ගිණුම හා සම්බන්ධ එවැනි යම් තොරතුරු වෙනත් යම් ආයතන වෙත දැඩි රහස්‍ය ලෙසින් හෙළිදරව් කිරීමේ අයිතිය HSBC විසින් රඳවා ගනු ලැබේ.

4) HSBC විසින් සිය තනි අභිමතය පරිදි යම් තෙවන පාර්ශ්වයන් වෙත යම් ක්‍රියාකාරකම් පැවරිය හැකි අතර පසු-කාර්යාල සැකසුම් හා වෙනත් බාහිරකරණය කළ ක්‍රියාකාරකම් සඳහා එවැනි තෙවන පාර්ශව ආයතන වෙත ගිණුම් පිළිබඳ තොරතුරු සැපයිය හැකිය. මේ සම්බන්ධයෙන්, HSBC සමූහය තුළ හෝ වෙනත් යම් ආයතනයක් හො නියෝජිතයෙකු හෝ බැංකුව විසින් භාවිතා කරන තෙවන පාර්ශ්වයක් සමඟ ගිණුම් හිමියා/හිමියන් පිළිබඳ, ගිණුම සහ/හෝ ගනුදෙනු පිළිබඳ තොරතුරු සැකසීමට, බෙදාගැනීමට, ගබඩාකිරීමට හෝ සම්ප්‍රේෂණය කිරීමට බැංකුවට අවශ්‍ය වන බවත්, ඒ සඳහා අවසර ලබාදෙන බවත් ගිණුම් හිමියා/හිමියන් වටහාගනියි. එවැනි තොරතුරු සකස් කිරීම, හුවමාරු කිරීම, ගබඩා කිරීම හෝ සම්ප්‍රේෂණය කිරිම රහසිගත පදනමක් මත සිදුකරන බවත් (අ) යම් අදාළ නීතිය, නියෝග හෝ රාජ්‍ය හෝ නියාමන අධිකාරියක් විසින් අන්‍යාකාරයකින් නියමකර සිටී නම් හෝ අවසර ලබා දෙයි නම් මිස හෝ (ආ) වංචාවක් වැලැක්වීමේ කාර්ය සඳහා හෙළිදරව් කිරීමට අවශ්‍ය වේ නම් හෝ (ඇ) ඩෙබිට් කාඩ්පත් පහසුකම ලබාදීම සඳහා එම හෙළිදරව් කිරීම අවශ්‍ය බවට බැංකුව සලකනු ලබයි නම් මිස, HSBC සමූහය ඇතුළත එම තොරතුරු දැඩි ලෙස රහස්‍යභාවයෙන් යුක්තව පවත්වාගෙන යෑම සඳහා බැංකුව දැඩි උත්සාහයක් දරනු ලැබේ. ගිණුම් හිමියන් සහ බැංකුව සියලු අදාළ දත්ත ආරක්ෂා කිරීමේ නීතිවලට එකඟව ක්‍රියා කරනු ලැබිය යුතුය. ස්වකීය පුද්ගලික හෝ වෙනත් දත්ත සම්ප්‍රේෂණය කර ඇති, සකස් කර ඇති හෝ අන්‍යාකාරයකින් පාලනය කර ඇති සියලු තැනැත්තන් මෙම නීති ප්‍රකාරව එකී සම්ප්‍රේෂණය කිරීම්, සකස් කිරීම් හෝ වෙනත් ආකාරයේ පාලනය කිරීම් සඳහා කැමැත්ත ප්‍රකාශකර ඇති ලෙස හෝ එකී සම්ප්‍රේෂණය කිරීම්, සකස් කිරීම් හෝ වෙනත් යම් පාලනය කිරීම්වලට පෙරාතුව එසේ කැමැත්ත ප්‍රකාශකර ඇති බවට ගිණුම් හිමියා තහවුරුකර සිටියි. මෙම විධිවිධාන උල්ලංඝණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරනු ලබන සියලු පිරිවැය, දඩ මුදල්, අලාභ, සහ වෙනත් පාඩුවලින් බැංකුව නිදහස්කර හානිපූරණය කර තැබීමට ගිණුම් හිමියා තව දුරටත් එකඟ වේ.

5) ඩෙබිට් කාඩ්පත භාවිතයෙන් සිදුකළ විදේශ මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කිරීමට HSBC විසින් අයිතිය රඳවා ගනියි.

**නැතිවූ හෝ සොරකම් කළ ඩෙබිට් කාඩ්පත්**

1) කාඩ්පත නැතිවී හෝ සොරකම් කර ඇති අවස්ථාවක දී එම නැතිවීම/සොරකම් කිරීම අනාවරණය වූ වහාම ඒ පිළිබඳව දුරකථන, ෆැක්ස් හෝ ටෙලෙක්ස් පණිවුඩ මඟින් බැංකුව වෙත දැනුම් දී, පොලීසියට ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දිය යුතුය. (විදේශයක දී නම් VISA හෝ MasterCard සාමාජිකයකු වෙත ඒ පිළිබඳ දැනුම් දිය යුතුය.) නමුත් එවැනි අවස්ථාවක

දී දුරකථනයෙන් ෆැක්ස් හෝ ටෙලෙක්ස් පණිවුඩ මගින් කරන ලද යම් වාර්තා කිරීමක් කාඩ්පත් හිමියාගේ හෝ ඔහු විසින් යථා පරිදි බලය පවරන ලද ඇටෝර්නි බලකරුගේ අත්සන යටතේ ලිඛිතව වහාම තහවුරු කළ යුතුය. කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම තහවුරු කරන තෙක් සහ පසුව ඉහත කී ආකාරයට බැංකුව වෙත හෝ VISA හෝ MasterCard සාමාජිකයෙකු වෙත ලිඛිතව එය පසුව තහවුරු කරන තෙක් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කාඩ්පත් ගිණුමට බැරවී ඇති සහ කාඩ්පත් ගිණුමට බැරවීමට නියමිත තවමත් අවසන් වී නොමැති සියලු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වග කිව යුතුය. කාඩ්පත් හිමියා විසින් එම නැතිවූ හෝ සොරකම් කළ කාඩ්පත (කාඩ්පත්) සොයා ගනු ලැබූ අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් වහාම එකී සොයා ගන්නා ලද කාඩ්පත (කාඩ්පත්) බැංකුව වෙත ආපසු භාරදිය යුතුය.

2) නැති වූ ඩෙබිට් කාඩ්පත ආරක්ෂිතව තබාගැනීම පිළිබඳව සාධාරණ උනන්දුවක් සහ උද්යෝගයක් ගෙන තිබූ බවට කාඩ්පත් හිමියා ඔප්පු කළේ නම් සහ නැතිවීම/සොරකම් කිරීම ප්‍රමාදයකින් තොරව වාර්තා කළ බව සහ කාඩ්පත් හිමියා සද්භාවයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළ හැකි නම් පමණක් මිස මෙම කොටසෙහි 1 වගන්තිය ප්‍රකාරව ඩෙබිට් කාඩ්පත නැතිවීම පිළිබඳව වාර්තා කිරීමෙන් පසුව නැති වූ කාඩ්පතක් සම්බන්ධයෙන් වෙළඳ ආයතනයක දී සිදුවන යම් ගනුදෙනු සඳහා බැංකුවේ බැඳීම ශුන්‍ය වන්නේය. (මෙම ගති ලක්ෂණය මෙහි මින් මතු 'නැතිවූ කාඩ්පත් පිළිබඳ ශුන්‍ය වගකීම' යනුවෙන් සඳහන් කරනු ලැබේ). එසේ වුවද ATM හරහා කරනු ලබන මුදල් ගනුදෙනුවල දී PIN අංකය අවශ්‍ය වන බැවින් සහ එය කාඩ්පත් හිමියාගේ රහසිගත කරුණක් වන බැවින්, නැති වූ කාඩ්පත් පිළිබඳ ශුන්‍ය වගකීම, ATM යන්ත්‍ර හරහා මුදල් ආපසු ගැනීමේ දී අදාළ නොවේ.

3) කාඩ්පත නැතිවී, මෙම කොටසෙහි 1 වගන්තිය ප්‍රකාරව, ඒ බව බැංකුව වෙත වාර්තාකර නොමැති අවස්ථාවක දී හෝ කාඩ්පත නැතිවීමෙන් පසුව මෙම කොටසෙහි 1 වගන්තිය ප්‍රකාරව HSBC වෙත දැනුම්දීමට පෙරාතුව හෝ කාඩ්පත සාවද්‍ය ලෙස භාවිත කර ඇති අවස්ථාවක දී, එම කාඩ්පත නැතිවීම හෝ සාවද්‍ය ලෙස භාවිතය හේතුවෙන් උපචිත විය හැකි (සිවිල් හෝ අපරාධ) වගකීමෙන්, පාඩු, පිරිවැය, වියදම් හෝ අලාභවලින් කාඩ්පත් හිමියා විසින් HSBC මෙයින් සම්පූර්ණයෙන් හානිපූරණය කර තබනු ලැබේ.

4) සියලු අදාළ නීතිරීති සහ කොන්දේසිවලට අනුව කාඩ්පත් හිමියා ක්‍රියාකර ඇත්නම්, නියමිත ගාස්තුවක් යටතේ HSBC හි පරම අභිමතය පරිදි ප්‍රතියෝජන ඩෙබිට් කාඩ්පතක් නිකුත් කරනු ලැබිය හැකිය. එම ප්‍රතියෝජන ඩෙබිට් කාඩ්පත නිකුත් කිරිමේ දී දරන ලද පිරිවැය HSBC විසින් ගිණුමෙන් හර කරනු ලැබේ.

5) ඉන් පසුව කාඩ්පත් හිමියා විසින් ඩෙබිට් කාඩ්පත අත්පත් කරගත හොත්, එය භාවිත නොකළ යුතුය. ඩෙබිට් කාඩ්පතෙහි චුම්භක තීරුව හරහා එය කැබලි කිහිපයකට කපාදැමීම මගින් එම කාඩ්පත විනාශ කළ යුතුය.

## අවසන් කිරීම

1) පූර්ව දැනුම්දීමකින් තොරව සහ කිසිදු හේතු දැක්වීමකින් තොරව ස්වකීය අභිමතය පරිදි ඩෙබිට් කාඩ්පත හෝ පිරිනමන ලද වෙනත් යම් සේවාවන් අවලංගු කිරීමේ/ආපසු ලබාගැනීමේ හෝ අලුත් කිරීමේ අයිතිය HSBC විසින් රඳවාගනු ලැබේ.

2) HSBC සමඟ පවත්වාගෙන යනු ලබන ගිණුම අවසන් කිරීමට ගිණුම් හිමියා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එම ගිණුම මත නිකුත් කරන ලද ඩෙබිට් කාඩ්පත ස්වයංක්‍රීයව අවලංගු වන්නේය. එවිට එම ගිණුමට සම්බන්ධ ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම ගිණුම් හිමියා විසින් වහාම අවසන්කර ඩෙබිට් කාඩ්පත විනාශකර ආපසු භාරදිය යුතුය. ගිණුමෙන් තවමත් හරකර නොමැති, ගෙවීමට නියමිත හිඟ ගනුදෙනු පවතින අවස්ථාවක දී, කාඩ්පත් හිමියාට HSBC විසින් අරමුදල් ආපසු ලබාදීමට පෙරාතුව අතිරික්ත මුදලින් එම හිඟ මුදල් අඩුකරනු ලැබිය යුතුය.

3) ඩෙබිට් කාඩ්පත බැංකුවේ දේපලක් වන අතර, බැංකුවේ ඉල්ලීම මත වහාම සහ කොන්දේසි විරහිතව බැංකුව වෙත ආපසු භාරදිය යුතු වේ. ඩෙබිට් කාඩ්පත භාරදීමට කලින් කාඩ්පත් හිමියා විසින් බැංකු නිලධාරියාගේ අනන්‍යතාවය තහවුරු කරගන්නා බවට වගබලාගත යුතුය.

4) ඩෙබිට් කාඩ්පත් පහසුකම වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කිරීමට HSBC වෙත හිමිකම ඇති අතර, පහත දැක්වෙන සිදුවීම්වලින් යමක් සිදුවුවහොත් ඩෙබිට් කාඩ්පත ආපසු භාරදිය යුතු වේ.

   i. මෙහි දක්වා ඇති නීතිරීතිවලට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත්වීම.
   ii. HSBC සමඟ එළඹ ඇති යම් ගිවිසුමක් හෝ එකඟතාවයක් හෝ යටතේ (අභඹු හෝ වෙනත් අයුරකින්) සිදුවන පැහැර හැරීමක්.
   iii. ගිණුම් හිමියා (හිමියන්) බංකොලොත්භාවයට හෝ වස්තුභංගත්ව නීති කටයුත්තකට හෝ ඊට සමාන නීති කටයුත්තකට ලක්වූ තැනැත්තෙකු වීම.
   iv. කාඩ්පත් හිමියා මියයෑම.
   v. ගිණුම වසාදැමීම හෝ ගිණුමෙහි අවශ්‍ය අවම ශේෂය පවත්වාගැනීමට අසමත් වීම.

**පොදු**

1) ලිපිනයන් හා දුරකථන අංකවල යම් වෙනසක් වුවහොත් ගිණුම් හිමියා (හිමියන්) විසින් ඒ බව වහාම HSBC වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

2) මෙම නීතිරීතිවලින් බැඳී සිටීමට එක් පුද්ගලයෙකුට වැඩි ගණනක් විසින් අත්සන් කළහොත් හෝ එකඟ වුවහොත්, සන්දර්භයට අනුව, මේ යටතේ එම තැනැත්තන්ගේ බැඳීම් එක් ව හා වෙන් වෙන් ව පවතින අතර, ඒකවචන පමණක් දක්වමින් මෙහි අඩංගු වචනවලට බහුවචන ද ඇතුළත් වන බව සැලකේ. එවැනි යම් තැනැත්තෙකුට මේ යටතේ ලබා දුන් යම් දැන්වීමක් එම සියලුම තැනැත්තන් වෙත ලබාදුන් ලෙසට සැලකේ.

3) කාඩ්පත් හිමියා වෙත සහ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) වෙත ඩෙබිට් කාඩ්පත් භාරදීම සඳහා බැංකුව විසින් එහි නියෝජිතයා ලෙස කුරියර් සේවාවක් සම්බන්ධ කරගනු ඇත. කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) වෙත ඩෙබිට් කාඩ්පත් ලැබුණු පසුව ඔහු/ඇය විසින් එය ලැබුණු බව වහාම දැන්විය යුතු අතර, එහිදී, ඔහුගේ/ඇයගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතු වේ. බැංකුව හෝ එහි නියෝජිතයා විසින් සිය අභිමතය පරිදි ඩෙබිට් කාඩ්පත එම ඩෙබිට් කාඩ්පත භාරදීම සඳහා විශේෂයෙන් කාඩ්පත් හිමියා විසින් දක්වා ඇති ලිපිනයේ සිටින කාඩ්පත් හිමියාගේ නියෝජිතයෙකු ලෙස බැංකුව හෝ එහි නියෝජිතයා නිශ්චය කරන තෙවන පාර්ශ්වයක් වෙත භාරදෙනු ඇත. එසේ භාරදුන් මොහොතේ පටන් ඩෙබිට් කාඩ්පත භාවිත කරමින් සිදුකරන සියලුම මුදල් ගැනීම් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකිව යුතු වේ. කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ අභිමතය පරිදි බැංකු ශාඛාවක දී ඩෙබිට් කාඩ්පත භාරගැනීමට ද, ඔහු/ඇය වෙනුවෙන් ලැබීම පිළිගැනීමට ද ලිඛිතව තෙවන පාර්ශ්වයකට අවසර දිය හැකිය. කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් අවසරලත් තැනැත්තා විසින් කාඩ්පත භාරගත් මොහොතේ පටන් ඩෙබිට් කාඩ්පත භාවිත කරමින් සිදුකරන සියලු මුදල් ගැනීම් සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

4) ඩෙබිට් කාඩ්පත නිකුත් කරනුයේ හුදෙක්ම කාඩ්පත් හිමියා (හිමියන්) වෙත වන අතර, එය කිසිදු ආකාරයකින් පැවරීමට හෝ සුරක්ෂිතයක් ලෙස උකස් තැබීමට නොහැක.

5) දැනුම් දෙනු ලබන අදාළ නීතිරීතිවලට යටත්ව, ඩෙබිට් කාඩ්පත මඟින් කාඩ්පත් හිමියාට කලින් කලට බැංකුව විසින් ලබාදෙනු ඇති පවතින හෝ අනාගත සේවාවන් යටතේ සියලු ATM ගනුදෙනු හා අලෙවි ආයතන සමඟ ගනුදෙනු කිරීමට හිමිකම ලබාදෙයි.

6) ATM යන්ත්‍රය මඟින් නිකුත් කරන ලද ප්‍රකාශන ලදුපත මඟින් ගිණුම් හිමියා විසින් තැන්පත් කරන ලද්දේ යැයි සැලකෙන දෑ පමණක් නියෝජනය වන අතර, එය බැංකුව කෙරෙහි බන්ධනීය නොවනු ඇත. ATM යන්ත්‍රයක් හරහා තැන්පත් කරන ලද්දේ යැයි කියන චෙක්පත් හෝ මුදල් මත, එකී චෙක්පත්/මුදල් ගිණුම් හිමියා (හිමියන්)ගේ ගිණුමට බැර කරන තෙක් සහ ඒවා ලබාගැනීමට පවතින තෙක්, ගිණුම් හිමියා (හිමියන්) විසින් ඩෙබිට් කාඩ්පත භාවිතා කර අරමුදල් ලබා නොගත යුතුය.

7) වෙනත් කාඩ්පතක් ලබාගැනීම හා ඩෙබිට් කාඩ්පත අලුත් කිරීම අදාළ වන යම් අවස්ථාවක දී බලාත්මකව පවතින නීතිරීතිවලට යටත් වනු ඇත.

8) බැංකුවට සන්නිවේදන ලබාදීම සඳහා තැපැල් තැන්පතු පහසුකම භාවිත කිරීම, සහ බැංකුවේ වාර්තා එම සන්නිවේදනයේ ස්වභාවය සහ බැංකුව විසින් එම සන්නිවේදන ලබාගත් කාලය පිළිබඳ සැලකිල්ලට ගෙන තීරණාත්මක සාක්ෂියක් ලෙස සලකනු ලැබිය යුතුය. එසේ ලබා දුන් සන්නිවේදනවල යම් අක්‍රමිකතාවක් සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතුය.

9) මෙම නීතිරීති සහ කොන්දේසි කාඩ්පත නිකුත් කළ රටෙහි අදාළ අවස්ථාවේ බලාත්මකව පවතින නීති මඟින් පාලනය වන අතර, ඊට අනුකූලව අර්ථනිරූපනය කෙරෙනු ඇත.

10) කාඩ්පත් හිමියා (හිමියන්) විසින් තමාගේ සන්තකයේ එක් ඩෙබිට් කාඩ්පතක් පමණක් තබාගත යුතු අතර, ප්‍රතියෝජන ඩෙබිට් කාඩ්පත (කාඩ්පත්) නිකුත්කර ඇති අවස්ථාවක දී, කාඩ්පත් හිමියා විසින් පවත්නා කාඩ්පත (කාඩ්පත්) අවලංගු කිරීම සඳහා බැංකුවට අවසර ලබාදිය යුතුය.

11) එක් වසරක කාලසීමාවක් භාවිත නොකළහොත් ඩෙබිට් කාඩ්පතෙහි වලංගු භාවය කල්ඉකුත් වන බව කාඩ්පත් හිමියා (හිමියන්) මතක තබාගත යුතුය. අලෙවි ආයතනවල දී සිදුකරන ආපසුගැනීම්, මාරුකිරීම් හා ගනුදෙනු පමණක් ගනුදෙනු ලෙස සැලකේ.

12) ඩෙබිට් කාඩ්පත භාවිතයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි යම් ජාලයක කොටසක් සංයුක්ත වන වෙනත් යම් බැංකු විසින් සවිකරනු ලැබ ඇති ATM යන්ත්‍ර භාවිත කිරීමේ දී, අනෙකුත් බැංකු විසින් සිදුකරන ලබන සියලු ගනුදෙනු කිරීම් ගනුදෙනු ලෙස සලකනු ලැබේ.

13) ජංගම ගිණුම් හා ඉතිරිකිරීමේ ගිණුම්වල මෙහෙයුම් පාලනය වන සියලුම නීතිරීති හා කොන්දේසි ඩෙබිට් කාඩ්පත භාවිත කර එම ගිණුම් මත සිදුකරන ගනුදෙනුවලට අදාළ වනු ඇත.

14) මෙහි අඩංගු නීතිරීති හා කොන්දේසි වෙනස් කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි. එසේ වෙනස් කරන ලද නීතිරීති හා කොන්දේසි HSBC වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කෙරෙන අතර, ගිණුම් හිමියා (හිමියන්)ගේ ඉල්ලීම මත, එහි පිටපතක් බැංකු ශාඛාවලින් ලබාගත හැකිවනු ඇත. එකී වෙනස බලගැන්වෙන දිනට පසුව කාඩ්පත භාවිත කිරීම මගින් (බැංකුවේ දැන්වීමෙහි දක්වා ඇති ලෙස) කාඩ්පත් හිමියා එවැනි වෙනස් කිරීමක් අවශේෂයකින් තොරව පිළිගෙන ඇතැයි සැලකෙනු ඇත. කාඩ්පත් හිමියා එවැනි වෙනස් කිරීමක්/සංශෝධනයක් පිළිනොගන්නේ නම්, එවැනි වෙනස් කිරීමක්/සංශෝධනයක් බලපැවැත්වෙන දිනයට පෙර ඩෙබිට් කාඩ්පත බැංකුව වෙත භාර දිය යුතුය.

15) මේ යටතේ තැපෑලෙන් එවනු ලබන යම් දැන්වීමක් බැංකුව වෙත අවසන් වරට ලිඛිතව දැනුම් දී ඇති ලිපිනයට තැපැල් කිරීමෙන් පසු වැඩකරන දින 07ක් තුළ කාඩ්පත් හිමියා (හිමියන්) වෙත ලැබී ඇති බවට සැලකෙනු ඇත. දේශීය පුවත්පත් දැන්වීමක් මගින් සහ/හෝ බැංකුවේ දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම මගින් සහ/හෝ ප්‍රකාශන පණිවුඩයක් මගින් ගාස්තු හා අයකිරීම් සහ/හෝ නීතිරීති වෙනස්වීම් පිළිබඳ දැන්වීම් කාඩ්පත් හිමියා (හිමියන්) වෙත දැනුම්දීමක් ලබාදීමක් ලෙස අර්ථනිරූපනය කෙරෙනු ඇත.

16) කාඩ්පත් හිමියා විසින් ඩෙබිට් කාඩ්පත භාවිතා කරමින් ලබාගත හැකි ශේෂය හෝ HSBC විසින් අවසර දී ඇති සීමාව ඉක්මවා මුදල් ලබාගන්නේ නම්, කාඩ්පත් හිමියා විසින් වහාම HSBC බැංකුව වෙත කොන්දේසි විරහිතව එසේ සීමාව ඉක්මවා ලබාගත් මුදල HSBC විසින් තීරණය කරනු ලබන අනුපාතයකට පොලිය හා, ඇත්නම්, දඩ මුදල් ද ඇතුළත්ව ගෙවිය යුතුය. කෙසේ වුවද, HSBC විසින් කිසියම් ආකාරයක අයිරා පහසුකමක් ලබාදීමට බැඳීමක් ඇති බවට ප්‍රකාශිත හෝ ව්‍යාංග එකඟතාවයක් ලෙස මෙය අර්ථ නොදැක්විය යුතුය.

17) යම් සේවාවක් සැපයීමට අසමත්වීමක් හෝ මේ යටතේ යම් බැඳීමක් ඉටුකිරීමට අසමත්වීමක් හෝ සම්බන්ධයෙන් එම අසමත්වීම (ඍජුව හෝ වක්‍රව) යම් ATM යන්ත්‍රයක හෝ ඩෙබිට් කාඩ්පතෙහි වරදක්, තාවකාලිකව අරමුදල් ප්‍රමාණවත් නොවීමක්, එහි පාලනයෙන් බැහැර යම් මතභේදයක් හෝ තත්ත්වයයක් නිසා සිදුවන අවස්ථාවක බැංකුව වගකිව යුතු නොවේ.

18) යම් එක් ගිණුමක් හෝ වැඩි ගණනක මෙහෙයුම් හා සම්බන්ධයෙන් හෝ ඩෙබිට් කාඩ්පත භාවිතා කිරීම සම්බන්ධයෙන් යම් ආරක්ෂක බිඳවැටීමක් හෝ වෙනත් සැකකටයුතු තත්ත්වයන් පිළිබඳව බැංකුව දන්නා හෝ සැකකරන අවස්ථාවක දී, බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි කිසිදු වගකීමකින් තොරව, යම් ගනුදෙනුවකට අවසරදීම ප්‍රතික්ෂේප කළ හැකි අතර, එවැනි අවස්ථාවක දී බැංකුව හැකි තාක් දුරට ඉක්මනින් ඒ බව කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙනු ඇත.

19) ඩෙබිට් කාඩ්පත හා ඊට අදාළ PIN අංකය නිකුත් කිරීම/භාවිතය/නැතිවීම සම්බන්ධයෙන් අදාළ හෝ ඉන් පැනනගින ආනුෂංගික හෝ වක්‍ර පාඩු හෝ හානි ද ඇතුළත්ව යම් පාඩුවක් හෝ හානියක් සඳහා HSBC බැංකුව වග නොකියනු ඇත.

20) මෙම නීතිරීතිවලට අමතරව, ඩෙබිට් කාඩ්පත් භාවිත කිරීම VISA මගපෙන්වීම්වලට ද යටත් වනු ඇත.

21) කාඩ්පත් හිමියා (හිමියන්) ට අලෙවි ආයතනවල දී ඩෙබිට් කාඩ්පත හරහා ස්ථාවර නියෝග ලබාදීමට නොහැකිය.

22) උපදෙස් ලබාදෙන හෝ ලබාදෙන්නේ යැයි උද්දේශිත පුද්ගලයාගේ බලය හෝ අනන්‍යතාව සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු පරීක්ෂාවක් නොකර, එසේ උපදෙස් ලැබෙන අවස්ථාව වන විට පවතින තත්ත්වයන් නොසලකා, කාඩ්පත් හිමියා හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථන, ටෙලෙක්ස්, ෆැක්ස්, කෙටි පණිවුඩ සේවා (SMS), පෞද්ගලික අන්තර්ජාල බැංකුකරණය (PIB) හා විද්‍යුත් තැපැල මඟින් වරින් වර ලබාදෙන හෝ ලබා දුන්නේ යැයි උද්දේශිත දැන්වීම්, උපදෙස්, අණකර හෝ වෙනත් දැන්වීමක් ('උපදෙස්') මත විශ්වාසය තැබීමට හා ඊට අනුකූලව ක්‍රියාකිරීමට කාඩ්පත් හිමියා බැංකුවට අවසර දී සිටියි. බැංකුව කාඩ්පත් හිමියා සමග අදහස් හුවමාරු කරගැනීමට දුරකථන, ටෙලෙක්ස්, ෆැක්ස්, කෙටි පණිවුඩ සේවා (SMS), පෞද්ගලික අන්තර්ජාල බැංකුකරණය (PIB) හා විද්‍යුත් තැපැල භාවිත කරනු ඇත. උපදෙස් ලැබීමේ දිනය/වේලාව සම්බන්ධයෙන් බැංකුවේ තීරණය අවසානාත්මක ලෙස කාඩ්පත් හිමියා පිළිගනු ඇත.

කාඩ්පත් හිමියා විසින් උපදෙස් සඳහා සම්පූර්ණයෙන් බලය ලබා දී ඇතැයි සැලකීමට ද එමඟින් කාඩ්පත් හිමියා බැඳී සිටින බවට සැලකීමට ද බැංකුවට අයිතිය ඇති අතර, එම උපදෙස්, මුදල් ගෙවීම සඳහා හෝ නැතිනම් යම් ගිණුමක් හර කිරීමට හෝ බැර කිරීමට හෝ යම් මුදලක් හෝ ලියවිල්ලක් බැහැර කිරීමට හෝ, කාඩ්පත් හිමියා බැංකුව සමග හෝ වෙනත් පුද්ගලයෙකු සමග කිසියම් ගිවිසුමකට හෝ වෙනත් සැලසුමකට උද්දේශිතව බැඳීමට හෝ කාඩ්පත් හිමියා වෙනත් ඕනෑම ආකාරයක ගනුදෙනුවකට හෝ සැලසුමකට යොමු කිරීමකට හෝ වුවද, එම ගනුදෙනුවේ හෝ සැලසුමේ ස්වභාවය හෝ ඊට සම්බන්ධ මුදල් ප්‍රමාණය නොසලකා, එම උපදෙස්වල වැරදි, දුරවබෝධතා, වරදවා වටහාගැනීම් හෝ පැහැදිලි බව අඩු වීම නොසලකා, එම උපදෙස් මත විශ්වාසය තබා හෝ ඒ සම්බන්ධයෙන් බැංකුව සුදුසු යයි සිතන ආකාරයට පියවර ගැනීමට බැංකුවට අයිතිය ඇත.

මෙම අවසර ලබාදීමේ හා වන්දිපූරණ නීතිරීතිවලට අනුකූලව බැංකුවේ ක්‍රියාකිරීමට සලකා, කාඩ්පත් හිමියා මෙමඟින් ආපසු හැරවිය නොහැකි ලෙස බැංකුව වන්දිපූරණය කිරීමට ද, උපදෙස් සම්බන්ධයෙන් හෝ එම උපදෙස්වලින් ඕනෑම ස්වභාවයකින් හා ඕනෑම ආකාරයකින් උද්ගත වන්නා වූ, බැංකුවට දරන්නට සිදුවන සියලු හානි, ඉල්ලා සිටීම්, නඩුකර, ක්‍රියාමාර්ග, ඉල්ලීම්, පිරිවැය හා වියදම් සඳහා වන්දිපූරණය කිරීමට භාරගනියි.

ඉහත කී ආකාරයට කාඩ්පත් හිමියා විසින් ලබා දුන් බලය යටතේ දරන ලද යම් වගකීමකින් කාඩ්පත් හිමියා නිදහස් කරනු නොලබන අවසන් කිරීමක් සහ මෙම ගිවිසුමේ නීතිරීති ප්‍රකාරව ඉටුකරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධ හානිපූරණයක් හැර, කාඩ්පත් හිමියාගෙන් අවසන්කිරීමේ නිවේදනයක් බැංකුව වෙත ලැබුණේ නම් සහ ලැබෙන තෙක් සහ ඒ මත ක්‍රියාකිරීමට සාධාරණ කාලයක් ලැබෙන තෙක් මෙම බලය ලබාදීමේ සහ හානිපූරණයේ නීතිරීති සම්පූර්ණයෙන් බලාත්මකව සහ ක්‍රියාත්මකව පැවතිය යුතුය.

ඩෙබිට් කාඩ්පත නිකුත්කිරීම සහ භාවිතය කලින් කල බලාත්මකව පවතින නීතිරීති සහ නියෝග, VISA මාර්ගෝපදේශ සහ HSBC නීතිරීති සහ කොන්දේසිවලට යටත් විය යුතුය. බැංකුවට පවරා ඇති සියලු බලය ලබාදීම් සහ බලතල වෙනස්කළ නොහැකි වේ. මෙම නීතිරීති සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූල බවට සහ ඒ අනුව පාලනය වන බවට සලකනු ලැබිය යුතුය. අදාළ කරුණු සම්බන්ධයෙන් වෙනත් යම් අධිකරණයක සමගාමී අධිකරණ බලය පැවතිය හැකි වුව ද එය නොසලකා, සියලු ආරවුල් ශ්‍රී ලංකාවේ අධිකරණවල පරම අධිකරණ බලයට යටත් වන්නේ ය.

**INT-LO-CON.SIN 2016.1**